සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

7 ශ්‍රේණිය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කාලය පැය 01 යි. මි. 30 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) පරිගණක ඒකකයේ මොළය ලෙස සලකන්නේ,

(1) සංදර්ශකය (Monitor) (2) මධ්‍ය සැකසුම් ඒකකය (CPU)
(3) මූසිකය (Mouse) (4) ක්ෂුද්‍ර පරිපථ (Microprocessors)

(02) තෙවන පරම්පරාවේ පරිගණක නිපදවීමට යොදා ගන්නා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය වන්නේ,

(1) ට්‍රාන්සිස්ටරය (Transistors) (2) රික්තක නළ (Vaccum Tubes)
(3) අනුකලිත පරිපථ (Integrated circuits) (4) ක්ෂුද්‍ර පරිපථ (Microprocessors)

(03) පරිගණක පද්ධතියේ සියලුම පාලන කටයුතු සිදු කරන්නේ,

(1) අංක ගණිතමය හා තාර්කික ඒකකය (ALU ) (2) පාලන ඒකකය (CU)
(3) මතක රෙජිස්තරය (Memory Register) (4) රික්තක නළ (Vacuum Tubes)

(04) ජංගම දුරකථන වල භාවිත වන මෙහෙයුම් පද්ධතියක් වන්නේ,

(1) Windows (2) MacOs (3) Android (4) Ubuntu

(05) ඝණ තත්ත්වයේ ආචයන උපක්‍රමයක් වන්නේ,

(1) දෘඪ තැටිය (Hard disk) (2) සංයුක්ත තැටිය (CD)
(3) පෑන් ධාවකය (Pen drive) (4) චුම්භක පටිය (Magnetic tape)

(06) බාහිරින් දැකිය හැකි පරිගණක දෘඩාංගයක් නොවන්නේ,

(1) මූසිකය (Mouse) (2) සංදර්ශකය (Monitor)
(3) දෘඪතැටිය (Hard disk) (4) යතුරු පුවරුව (Keyboard)

(07) ගොනුවක් සුරැකීමට අදාල විධානය වන්නේ,

(1) open (2) save (3) new (4) print

(08) අනිෂ්ඨ මෘදුකාංග වර්ගයක් නොවන්නේ,

(1) ට්‍රෝජන් අශ්වයා (Trojan Horse)
(2) පරිගණක වෛරස (Computer virus)
(3) උබුන්ටු (Ubuntu)
(4) පරිගණක වර්ම්ස් (Computer worms)

(09) ඇල්ගොරිතමයක ඇති උපදෙස් එකින් එක අනුපිළිවෙලින් ඉහළ සිට පහළට ක්‍රියාත්මක වීම හඳුන්වනු ලබන්නේ,

(1) අනුක්‍රමය (Sequence)
(2) පාලනය (Control)
(3) තේරීම (Select)
(4) පුනර්කරණය (Repetition)

(10) banana යන වචනය කැපිටල් අකුරු ලෙස යතුරු ලියනය කිරීමට භාවිතා කරන යතුර වන්නේ,

(1) Capslock (2) Delete (3) Enter (4) Backspace

(ලකුණු 2 x 10 = 20)

- **පහත සඳහන් ප්‍රකාශ හරි නම් ලකුණ ද (✓) වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

(11) ට්‍රාන්සිස්ටර් (Transistor) පළමු පරම්පරාවේ පරිගණක සඳහා භාවිතා කරන ලදී. (......)

(12) යතුරු පුවරුව දෙස නොබලා වේගයෙන් හා නිවැරදිව යතුරු හැසිරවීම ස්පර්ශය යතුරු කරණයයි. (......)

(13) ජංගම දුරකථන සඳහා ජීවමිතික මුරපද (Biometric Password) භාවිත කරයි. (......)

(14) දෘඪතැටි (Hard disk) ප්‍රකාශ මාධ්‍ය (Optical media) උපක්‍රමයකි. (......)

(15) ගොනු බහාලුමක් (Folder) තුළ ගොනු (file) එකක් හෝ කිහිපයක් තිබිය හැකිය. (......)

(ලකුණු 2 x 5 = 10)

- **(අ) කොටසට ගැලපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා යා කරන්න.**

| | (අ) | (ආ) |
|---|---|---|
| (16) | මධ්‍ය සැකසුම් ඒකකයේ වේගය මනිනු ලබන්නේ | Wordstar |
| (17) | චුම්බක මාධ්‍ය උපක්‍රමයකි. | විලායක (fuse) |
| (18) | පරිගණක සඳහා භාවිතා වන මෙහෙයුම් පද්ධතියකි | හර්ට්ස් (hertz) |
| (19) | පළමු වදන් සැකසීමේ වැඩසටහන වන්නේ | උබුන්ටු (ubuntu) |
| (20) | හදිසියේ ඇතිවන අධි විදුලි ධාරාවක් ගැලීම නිසා පරිගණකයට වන හානිය අවම කිරීමට භාවිත කරයි. | දෘඪතැටිය (hard disc) |

(ලකුණු 2 x 5 = 10)

## II - කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(01) (i) පහත දැක්වෙන ගැලීම් සටහන් සංකේත හඳුනාගෙන යා කරන්න.



තීරණ

ගැලීම් දිශාව

ක්‍රියාවලිය

ආරම්භය / නිමාව

ආදානය / ප්‍රතිදානය

(ලකුණු 2 x 5 = 10)

(ii) සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සෙවීමට අදාළ ආදානය, ක්‍රියාවලිය සහ ප්‍රතිදානය ලියා දක්වන්න.

(a) ආදානය :- ..........................................................................................................

(b) ක්‍රියාවලිය :- ..........................................................................................................

(c) ප්‍රතිදානය :- ..........................................................................................................

(ලකුණු 2 x 3 = 06)

(iii) සමන් විසින් පරිගණකයේ ගබඩා කර තිබූ ගොනුවක් පහත දැක්වේ.




ඉහත ගොනුවේ A සහ B කොටස් දෙක නම් කරන්න.

A :- ..........................................................................................................

B :- ..........................................................................................................

(ලකුණු 2 x 2 = 04)

(02) (i) පහත සඳහන් එක් එක් පරිගණක පරම්පරාවේදී භාවිත කරන ලද ඉලෙක්ට්‍රොනික තාක්ෂණය වරහන් තුළින් තෝරා ලියා දක්වන්න.

(a) පළමු පරම්පරාව :- ..........................................

(b) දෙවන පරම්පරාව :- ..........................................

(c) තෙවන පරම්පරාව :- ..........................................

(d) සිව්වන පරම්පරාව :- ..........................................

(අනුකලිත පරිපථ, රික්තක නළ, ක්ෂුද්‍ර පරිපථ, ට්‍රාන්සිස්ටර්)

(ලකුණු 1.5 x 4 = 06)

(ii) පරිගණක වල භාවිත වන මෙහෙයුම් පද්ධති 02 ක් නම් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

(ලකුණු 2 x 2 = 04)

(iii) වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් ලැබෙන වාසි 02 ක් ලියන්න.

.............................................................................................................................

.............................................................................................................................

(ලකුණු 3 x 2 = 06)

(iv) වදන් සැකසීම සඳහා භාවිත කළ හැකි මෘදුකාංග 02 ක් නම් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

(ලකුණු 2 x 2= 04)

(03) (i) පහත දැක්වෙන ආචයන උපක්‍රම වර්ග කර දක්වන්න.

[සංයුක්ත තැටි (CD), දෘඪ තැටි (Hard Disk), සංඛ්‍යාංක බහුවිධ තැටි (DVD), මතක කාඩ්පත් (Memory Card), පෑන් ධාවක (Per drive), චුම්භක පටි (Magnetic tape)]

| ප්‍රකාශ මාධ්‍ය උපක්‍රම | චුම්භක මාධ්‍ය උපක්‍රම | ඝන තත්වයේ උපක්‍රම |
|---|---|---|
| | | |
| | | |

(ලකුණු 2 x 6 = 12)

(ii) පද්ධති ඒකකය තුළ දැකිය හැකි දෘඩාංග 02 ක් නම් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

(ලකුණු 2 x 2 = 4)

(iii) පරිගණකයේ දෘඩාංග වලට හානි සිදුවිය හැකි ආකාර 02 ක් ලියා දක්වන්න.

.............................................................................................................................

.............................................................................................................................

(ලකුණු 2 x 2 = 4)

## පිළිතුරු පත්‍රය I - කොටස

| | | | | |
|---|---|---|---|---|
| (01) 2 | (02) 3 | (03) 2 | (04) 3 | (05) 3 |
| (06) 3 | (07) 2 | (08) 3 | (09) 1 | (10) 1 (2 x 10 = 20) |
| (11) (✗) | (12) (✓) | (13) (✓) | (14) (✗) | (15) (✓) (2 x 5 = 10) |

(16) හර්ට්ස් (hertz) (17) දෘඪතැටිය (hard disc) (18) උබුන්ටු (ubuntu)

(19) Wordstar (20) විලායක (fuse) (2 x 5 = 10)

## II - කොටස

(01) (i)




(2 x 5 = 10)

(ii) (a) ආදානය :- දිග හා පළල

(b) ක්‍රියාවලිය :- දිග X පළල

(c) ප්‍රතිදානය :- වර්ගඵලය (2 x 3 = 06)

(iii) A :- ගොනු නාමය B :- ගොනු දිගුව (2 x 2 = 04)

(02) (i) (a) පළමු පරම්පරාව :- රික්තක නළ

(b) දෙවන පරම්පරාව :- ට්‍රාන්සිස්ටර්

(c) තෙවන පරම්පරාව :- අනුකලිත පරිපථ

(d) සිව්වන පරම්පරාව :- ක්ෂුද්‍ර පරිපථ (1.5 x 4 = 06)

(ii) Windows, Ubuntu, MS DOS, Mac OS, Fedora (2 x 2 = 04)

(iii) ලේඛන නිර්මාණය, ලේඛන මුද්‍රණය, පසු භාවිතයට සුරැකීම, ලේඛනයේ වචන සෙවීම, වචන ගණන් කිරීම, ලේඛන සංස්කරණය, පිටපත් ගණනාවක් මුද්‍රණය කිරීම, අක්ෂර හා ව්‍යාකරණ දෝෂ පෙන්වාදීම සහ නිවැරදි කිරීමට අවස්ථාව ලබා දීම. (3 x 2 = 06)

(iv) Microsoft office word, iWork pages, Open office writer, Word perfect (2 x 2= 04)

(03) (i)

| ප්‍රකාශ මාධ්‍ය උපක්‍රම | චුම්භක මාධ්‍ය උපක්‍රම | ඝන තත්වයේ උපක්‍රම |
|---|---|---|
| CD | Hard disk | Memory card |
| DVD | Magnetic tape | Pen drive |

(2 x 6 = 12)

(ii) මවු පුවරුව, සිසිලන පංකා, ජව සැපයුම් ඒකකය, අංකිත වීඩියෝ තැටි ධාවකය, දෘඪ තැටිය (2 x 2 = 4)

(iii) හදිසි විදුලි විසන්ධි වීම, අධික විදුලි ධාරාවක් ලැබීම, සොර සතුරන්ගේ උවදුරු මගින්, පරිගණක පද්ධතියේ ඇතුළත අධික ලෙස රත් වීමෙන්, පරිගණක දෘඩාංග වලට දූවිලි තැන්පත් වීම. (2 x 2 = 4)